**B**

# නිවේදනය

ගරු මන්ත්‍රීවරුනී, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අවසන් කෙටුම්පත සාකච්ඡා කිරීම පිණිස 2017 පෙබරවාරි මස 22 වැනි බදාදා එනම් හෙට දින පූර්ව භාග 9.30 ට කාරක සභා කාමර අංක 01 හි දී තුන්වැනි රැස්වීම පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කර ඇති බැවින් ඊට පැමිණ සහභාගිවන මෙන් සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට කාරුණිකව මෙයින් දන්වනු කැමැත්තෙමි.

මීට ඉහතදීද අවස්ථා දෙකකදී පවත්වන ලද රැස්වීම්වලට සක්‍රීය ලෙස පැමිණ සහභාගිවී දැක්වූ උනන්දුව සහ උද්‍යෝගය වෙනුවෙන් ගරු මන්ත්‍රීතුමන්ලාට මාගේ හදපිරි ස්තූතිය පිරිනමන අතරම ඉතිරි ස්ථාවර නියෝග තවදුරටත් සාකච්ඡා කිරීමට අවශ්‍ය සම්පූර්ණ සහයෝගය ලබාදෙන මෙන් සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉතාමත් කාරුණිකව ඉල්ලා සිටිමි.